# 19 තමන් උපමා කොට අනුන්ට හිතවත් වෙමු


පරණ අවුරුද්ද ගෙවී අලුත් අවුරුද්ද ලැබීමට පෙර නොනගතය හෙවත් පුණ්‍ය කාලය උදා විය. සියලු වැඩ අවසන් කළ 'එකමුතු' ළමා සමාජයේ අපි සියලු දෙනා පන්සලට පැමිණියෙමු. බෝ මළුව, චෛත්‍යය මළුව, බුදු මැදුර, ඇමද පිරිසිදු කළ අපි රැගෙන ගිය මල් පහන්, සුවඳ දුම්, සකස් කොට පූජා කරන විට පන්සලේ ලොකු හාමුදුරුවෝ එහි වැඩියහ. අපි සියලු දෙනා පසඟ පිහිටුවා වැඳ උන්වහන්සේගේ ආශිර්වාද ලබා ගත්තෙමු. ආගමික වතාවත්වලින් අනතුරු ව අපි උන්වහන්සේට ධර්ම දේශනා කරන ලෙස ආරාධනා කළෙමු. එම ආරාධනාව කාරුණික ව පිළිගත් උන්වහන්සේ වේළුද්වාර සූත්‍රය තේමා කොට ගෙන ධර්ම දේශනාව පැවැත්වූහ. එදා කළ ඒ ධර්ම දේශනය මට අද වගේ හොඳට මතකයි. උන්වහන්සේ මුලින් ම පැහැදිලි කර දුන්නේ වේළුද්වාර සූත්‍රයේ නිදාන කථාවයි.



පින්වත් දරුවනි, අපේ බුදුරජාණන් වහන්සේ එක දවසක් භික්ෂූන් වහන්සේලා පිරිවරාගෙන කොසොල් ජනපදයේ පිණ්ඩපාතයට වඩින අතර වේළුද්වාර නම් බමුණු ගෘහපතියන්ගේ ගම්මානයට ද වැඩම කළා. එසේ වැඩිය බව දැනගත් වේළුද්වාර ගම් වැසි බමුණු ගෘහපතියෝ "ශාක්‍ය කුලයෙන් පැවිදි වූ ගෞතම බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලා පිරිවරා ගෙන අපේ ගමට පිඬු සිඟා වැඩියලු. උන් වහන්සේගේ කීර්ති නාමය මෙසේ පැතිරී තිබෙනවා. ඒ භාග්‍යවතුන් වහන්සේ අරහත් ය. සම්මා සම්බුද්ධ ය, විජ්ජාචරණ සම්පන්න ය, සුගත ය, ලෝකවිදූ ය, අනුත්තර පුරිසදම්මසාරථී ය, සත්ථා දේවමනුස්සානං ය, බුද්ධෝ ය,

භගවා ය, එසේ ම උන්වහන්සේ මේ ලෝකයේ සියල්ල දැන සිටින සේක. දැනගත් ඒ සියල්ල මුල මැද අග මනා කොට දේශනා කරන සේක. උන්වහන්සේ බ්‍රහ්මචාරී ය. එබඳු උත්තමයන් දැකීමත් යහපත් යැ'යි කතිකා කොට ඔවුන් සියලු දෙනා බුදුරජාණන් වහන්සේ කරා පැමිණියා.

එසේ පැමිණි ඔවුන්ගෙන් ඇතැමෙක් බුදුරජාණන් වහන්සේට වැඳ එකත්පස් ව සිටියා. ඇතැමෙක් බුදුරදුන් සමඟ සතුටු සාමීචි කථා කොට එකත්පස් ව සිටියා. සමහරෙක් උන්වහන්සේ වෙත එළඹ ඇඳිලි බැඳ එකත්පස් ව සිටියා. තවත් අයෙක් බුදුරජාණන් වහන්සේගෙන් තොරතුරු විමසා එකත්පස් ව සිටියා. ඇතැම් කෙනෙක් පැමිණ නිශ්ශබ්ද ව එකත්පස් ව සිටියා. මෙසේ එකත්පස් ව සිටි වේළුද්වාර ගම්වැසි බ්‍රාහ්මණ ගෘහපති පිරිස් බුදුරජාණන් වහන්සේගෙන් මෙහෙම ඇහුවා.



"භාග්‍යවත් ගෞතමයෙනි, අපි අඹු දරුවන් පෝෂණය කරමින් විවිධ බැඳීම් සහිත ව සිටිමු. සිනිඳු සඳුන් තවරාගෙන සිටිමු. මල් සුවඳ විලවුන් දරාගෙන සිටිමු. රන් රිදී පැළඳ ගෙන වාසය කරමු. මෙසේ කාමභෝගී ජීවිත ගත කරන අපි මරණින් පසු සුගතියට පැමිණීමේ ප්‍රාර්ථනා ඇත්තෝ වෙමු. එවැනි කාමභෝගී ජීවිත ගත කරමින් සිටින අපට ඔබ වහන්සේ ධර්ම දේශනා කරන සේක් වා" යි ආරාධනා කළා.



එවිට බුදුරජාණන් වහන්සේ "ගෘහපතියනි, අසන්න, මම නුඹලාට මැනවින් ධර්ම දේශනා කරමි" යි වදාළා. ඔවුන්,

"එසේ ය ස්වාමීනි, අපි ධර්මය අසන්නෙමු"යි පිළිතුරු දී ධර්ම ශ්‍රවණයට සූදානම් වුණා.

ඉතින් දරුවනි, අපේ බුදුරජාණන් වහන්සේ ඉන්පසු ව එම බමුණු ගෘහපතියන් ට සිල්වතුන් බවට පත් වන අයුරු දේශනා කළා. සිල්වත් වීමට නම් කෙනකුගේ කය සහ වචනය සංවර විය

යුතුයි. කයෙන් කෙරෙන වැරැදි තුනෙන් ද, වචනයෙන් කෙරෙන වැරැදි හතරෙන් ද, වෙන් විය යුතු බව පෙන්වා දුන්නා. උන්වහන්සේ ඒවා පෙන්වා දුන්නේ තමාට තමා උපමා කොට ගනිමින් ක්‍රියා කරන ආකාරයෙනි.

**කයෙන් සංවර කරන අයුරු**

කයෙන් සිදුවන වැරැදි තුනකි. ඒවා නම්,

- ප්‍රාණඝාතය
- අදත්තාදානය
- කාමමිථ්‍යාචාරය

මේ වැරැදි තුන කිරීමෙන් වැළකී සිටීම කය සංවර කර ගැනීමයි. එසේ සංවර වන්නේ මේ අයුරිනි.

## ප්‍රාණඝාතයෙන් වැළකී සිටීම

මා මේ ලෝකයේ ජීවත් වීමට කොතරම් ප්‍රිය කරනවා ද? මැරෙන්නට කොතරම් අකැමැත්තක් දක්වනවා ද? සැප විඳීමට කොතරම් ප්‍රිය කරනවා ද? දුක ප්‍රතික්ෂේප කරන්නේ ඒ නිසා ය. එසේ සිටින විට කෙනකු මාව මරන්නේ නම් මා එයට අකැමැති ය. එය මට ප්‍රිය නො වෙයි. කුමක් නිසා ද මා ජීවත් වීමට එතරම් ම දැඩි ප්‍රිය මනාප බවක් දක්වන බැවිනි. එසේ ම මේ ලෝකයේ අනෙක් සෑම ජීවියකු ම තවත් මොහොතක් හෝ ජීවත් වීමට කැමැති ය. මැරෙන්නට අකැමැති ය. සැප විඳීමට කැමැති ය. දුක ප්‍රතික්ෂේප කරයි. එබැවින් මට අප්‍රිය යමක් වේ ද ලොව සියලු දෙනාට ද එය අප්‍රියයි. මට ප්‍රිය යමක් වේ ද ලොව සියලු දෙනාට ද ප්‍රියයි. මෙසේ සිතා මම ප්‍රාණඝාතයෙන් හෝ සතුන්ට හිංසා කිරීමෙන් වැළකෙමි. අනෙක් අය ද එයින් වළක්වමි. එයින් වැළකී සිටීමේ ආනිසංස කියා දෙමි. මම මෙයින් වැළකෙන්නේ මම මගේ ජීවිතයට ප්‍රිය කරන්නා සේ ම අන්‍යයන් ද තමාගේ ජීවිතයට ප්‍රිය කරන බව දන්නා නිසා ය. ඒ සේම මම ද හිංසනයට, පීඩනයට, ඝාතනයට අකමැති නිසා ය.

## සොරකමෙන් වැළකීම

යමෙක් මාගේ වස්තුව අනුදැනුමක් නොමැති ව සොර සිතින් නො දැනුවත් ව ගන්නේ නම් මා එයට අකැමැති ය. අනුන් සතු යම් වස්තුවක් ඔහු නො දැනුවත් ව සොර සිතින් මා ගන්නේ නම් එයට ඔහු ද අකැමැති ය. යමක් මට අප්‍රිය ද, අකැමැති ද, ලොව අන් සෑම කෙනකුට ම එය අප්‍රිය ය. අකැමැති ය. එසේ නම්

මට අප්‍රිය දෙයෙහි මා අන්‍යයා යොදවන්නේ කෙසේ ද? මේ නිසා මම සොරකම් කිරීමෙන් වැළකෙමි. අන්‍යයන් ද එයින් වළකමි. සොරකම් නො කිරීමෙන් ලැබෙන ආනිසංස කියා දෙමි. මෙසේ මා සොරකම් නො කරන්නේ මා මෙන් ම අන්‍යයන් ද සොරකම අප්‍රිය කරන බව මා දන්නා නිසා ය.

## කාමමිථ්‍යාචාරයෙන් වැළකීම

යමෙක් මාගේ බිරිඳ සමඟ අනිසි ලෙස හැසිරෙන්නේ නම් මා එයට අකැමැති ය, මම එය ප්‍රිය නො කරමි, මා ද අනෙකකුගේ බිරිඳ සමඟ එලෙසින් හැසිරෙන්නේ නම් ඔහුට ද එය ප්‍රිය නො වෙයි. ඔහුත් එයට අකැමැති ය. යමක් මට අප්‍රිය නම් ලොව අන් සැම සතුන්ට ද එය අප්‍රිය ය. යමක් මට ප්‍රිය නම් අන් සැම සතුන්ට ම එය ප්‍රිය ය. එසේ නම් මට අප්‍රිය දෙයෙහි අන්‍යයා යොදවන්නේ කෙසේ ද? මේ නිසා මම කාමයේ වැරැදි ලෙස හැසිරීමෙන් වැළකෙමි.

අන්‍යයා ද එයින් වළක්වමි. එසේ වැළකී සිටීමේ ආනිසංස කියා දෙමි. මා එසේ වැළකෙන්නේ මා මෙන් ම ලොව අන් සැම කෙනකු ම එවැනි දේට අකැමැති බව දන්නා නිසා ය.

මේ ආකාරයට සිතා යමෙක් එම වැරැදි තුනෙන් වැළකී අන්‍යයා ද වළක්වා මෙම වැරැදි තුන නො කිරීමෙන් ලැබෙන ආනිසංස කියා දෙමින් කටයුතු කරන විට ඔහුගේ හෝ ඇයගේ කයෙහි සංවරය සිදුවන බව බුදුරජාණන් වහන්සේ පැහැදිලි ව වදාළ සේක.

**වචනයෙන් සංවර වන අයුරු**

වචනයෙන් සිදුවන වැරැදි හතරකි.

- බොරු කීම
- කේලාම් කීම
- පරුෂ වචන කීම
- හිස් වචන කීම

යමෙක් මෙම වැරැදි හතර නො කර සිටින්නේ නම් වචනයේ සංවර බව ඇති වේ. එම සංවර බව ඇති වන්නේ මේ අයුරිනි.

## බොරු කීමෙන් වැළකීම

යමකු බොරු කියා මා රවටන්නේ නම් මා එයට අකැමැති ය. මම එය ප්‍රිය නො කරමි. මා ද බොරු කියා අන්‍යයන් රවටන්නේ නම් ඔවුහු ද එය ප්‍රිය නො කරති. එබැවින් මට යමක් අප්‍රිය වේ ද, අනෙක් සියල්ලන්ට ද එය අප්‍රිය යි. ඒ අනුව අප්‍රිය දෙයෙහි අන් අය මා යොදවන්නේ කෙසේ ද? ඒ නිසා මම බොරු කීමෙන් වැළකී සිටිමි. අන් අය ද එයින් වළක්වමි. එසේ වැළකී සිටීමේ ආනිසංස කියා දෙමි. එලෙසින් මා වැළකෙන්නේ මා එයට අකැමැති වනවා සේ ම අන් සැම දෙනා ම එයට අකැමැති බව මා දන්නා නිසා ය.

## කේලාම් කීමෙන් වැළකීම

යමකු කේලාම් කියා මා හා මගේ මිතුරන් අතර බිඳවීමක් අසමගියක් ඇති කරවන්නේ නම් මා එයට අකැමැති ය. මට අප්‍රිය දෙය අන් අයට ප්‍රිය වන්නේ කෙසේ ද? එවැනි දෙයෙහි තවකකු යොදවන්නේ කෙසේ ද? එබැවින් මම කේලම් කීමෙන් වැළකී සිටිමි. අන්‍යයා ද එයින් වළකමි. එයින් වැළකී සිටීමේ අනුසස් කියා දෙමි. මේ අනුව මා කේලාම් නො කියන්නේ මා මෙන් ම අන් සැම කෙනකු ම කේලාම් කීම අප්‍රිය කරන නිසා ය.

## පරුෂ වචන කීමෙන් වැළකීම

යම් කෙනකු පරුෂ වචන කියා මට බනින්නේ නම් මා එයට අකැමැති ය. මම එය අප්‍රිය කරමි. මා අන් අයකුට පරුෂ වචනයෙන් බනින්නේ නම් ඔහු ද එයට අකැමැති ය. ඔහු ද එය අප්‍රිය කරයි. එසේ නම් මට අප්‍රිය දෙයක මා අන්‍යයා යොදවන්නේ කෙසේ ද? මේ නිසා මම පරුෂ වචන කීමෙන් වැළකෙමි. අන්‍යයා ද එයින් වළක්වමි. එසේ වැළකී සිටීමේ අනුසස් කියා දෙමි. මේ අනුව පරුෂ වචන නො කියන්නේ මා ඒවාට අකැමැති සේ ම අන්‍යයා ද අකැමැති බව දන්නා නිසා ය.

## හිස් වචන කීමෙන් (සම්පප්‍රලාපයෙන්) වැළකීම

යමකු මෙලොවට හෝ පරලොවට හෝ තමාට හෝ අනුන්ට හෝ ප්‍රයෝජනයක් නොවන හිස් වචන කතා කරත් නම් මා එයට අකැමැති ය. මා එසේ හිස් වචන කථා කරමින් කාලය කා දමන්නකු ලෙස හැසිරෙන්නේ නම්

අන්‍යයන් ද එයට අකැමැති ය. ඔවුහු එය අප්‍රිය කරති. මට අප්‍රිය දෙයෙහි මා අන්‍යයා යොදවන්නේ කෙසේ ද? ඒ අනුව මම හිස් වචන කීමෙන් වැළකෙමි. අන්‍යයා ද එයින් වළක්වමි. වැළකී සිටීමෙන් ලැබෙන ආනිසංස කියා දෙමි. මා හිස් වචන කථා නො කරන්නේ එයින් ඵලයක් නො වන බව මා මෙන් ම අන්‍යයා ද දන්නා නිසාත් එය අප්‍රිය කරන නිසාත් ය.

මෙලෙසින් සිතා යමකු වචනයෙන් සිදුවන වැරැදි හතරෙන් වැළකී අන්‍යයා ද ඒවායින් වළක්වා ඒවා නො කිරීමෙන් ලැබෙන අනුසස් කියා දෙමින් කල් ගතකරයි නම්, ඔහුගේ හෝ ඇයගේ වචනයෙහි සංවර බව සිදුවන්නේ යැයි බුදුරජාණන් වහන්සේ ඉගැන් වූ සේක.

එබැවින් යමෙක් කයෙන් හෝ වචනයෙන් සංවර වන්නේ ද ඔහු හෝ ඇය සිල්වතකු, සිල්වතියක ලෙස හඳුන්වනවා. මේ ආකාරයට බුදුහාමුදුරුවෝ ධර්ම දේශනාව කළ පසු වේළුද්වාර වැසි බමුණු ගෘහපතියන් දිවි හිමියෙන් තෙරුවන් සරණ ගිය බෞද්ධ උපාසකයන් බවට පත්වුණා. එසේ නම් දරුවනි, අපත් දිවි හිමියෙන් කය වචන දෙකෙන් කරන වැරැදිවලින් වැළකී සිල්වතුන් බවට පත් වෙමු. එවිට අපට සැම විට ම තමා උපමා කර ගනිමින් ලෝකයා කෙරෙහි හිතානුකම්පී ව කටයුතු කිරීමට හැකියාව ලැබෙනවා. මෙය අත්තූපනායික ධර්මපර්යාය නමින් හඳුන්වා තිබෙනවා.

දරුවනි, මේ බුදු වදන්වලින් අපට පැහැදිලි වන්නේ තමා තුළ සෙසු ජීවීන් කෙරෙහි හිතවාදී ආකල්ප ඇති කරගෙන ක්‍රියා කළ යුතු ආකාරයයි. මේ නිසා අප සත්ත්ව හිංසාව, පීඩාව, ඝාතනය ආදිය මෙන් ම වංචනය, දූෂණය වැනි දේවල් නො කළ යුත්තේ අප ද ඒවාට අකැමැති නිසාවෙන් ය. මෙසේ සිතා අපි සියලු දෙනා උදාර සිල්වත් දරුවන් වීමට අදිටන් කර ගනිමු.

**සාරාංශය**

බුදුරජාණන් වහන්සේ කොසොල් රටේ වේළුද්වාර ගමෙහි බමුණු ගෘහපතියන්ගේ ආරාධනාවෙන් වේළුද්වාර සූත්‍රය දේශනා කළහ. මෙම සූත්‍රයෙන් කයෙහි සංවරභාවයත් වචනයෙහි සංවරභාවයත් ඇති කර ගෙන සිල්වතකු වන අයුරු පැහැදිලි වෙයි. තමා උපමා කොට ගෙන සෙසු ජීවීන් කෙරෙහි කටයුතු කිරීම මෙහි දී අත්තූපනායික ධර්මපර්යාය ලෙස හැඳින්වෙයි. තමා හිංසාව, පීඩාව, ඝාතනය, දූෂණය, වංචාව ආදී වැරැදි පිටු දැකිය යුත්තේ පාපයට ඇති බිය නිසා පමණක් නො ව තමා ද අනුන් ද ඒවාට අකැමැති නිසා බව මෙයින් පැහැදිලි කෙරෙයි.

**ක්‍රියාකාරකම**

1. වේළුද්වාර සූත්‍රයේ නිදාන කථාව ලියන්න.
2. වචනයෙන් කෙරෙන වැරැදි නම් කරන්න.
3. ආගම් භේදයෙන් තොර ව ඕනෑ ම අයකුට අත්තූපනායික ධර්මපර්යාය අනුගමනය කළ හැකි බව ඔබ පිළිගන්නේ දැයි පැහැදිලි කරන්න.

**පැවරුම**

ඔබේ පන්තියේ සිසු සිසුවියන් හා එක් ව "සත්ත්ව හිංසාවෙන් වැළකෙමු" යන තේමාව යටතේ චිත්‍ර හා පෝස්ටර් ඇඳ පාසලේ ප්‍රදර්ශනය කරන්න.